(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

**අංක 13(10).]**

# පාර්ලිමේන්තුවේ අංක 13 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2015 මාර්තු මස 20 වැනි සිකුරාදා**

---

## 2015 අප්‍රේල් මස 07 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ඉඩම් අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝගය,—1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 31 දිනැති අංක 1886/58 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.03.17 දින ඉදිරිපත් කළ නියෝග අනුමත කළ යුතු ය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2015 අප්‍රේල් මස 21 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4399/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මහනුවර දිස්ත්‍රික් වන නිලධාරී කොට්ඨාස කාර්යාලය මගින් පාලනය වන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම්වල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පයිනස් සහ වෙනත් වගාවන් වගා කර ඇති බව දන්නේද;

(iii) එලෙස වගා කර ඇති වනාන්තර බිම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් වගා කර ඇති ඉඩම් අනවසරයෙන් පුද්ගලයින් විසින් අල්ලාගෙන ඇති බවත්;

(ii) එම ඉඩම්වලින් කොටසක් රජය මගින් මහජනතාව සඳහා ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉහත (අ)(iii) හි සඳහන් වනාන්තර භූමි ප්‍රදේශයෙන් පුද්ගලයින් අනවසරයෙන් පදිංචි වී ඇති ඉඩම් ප්‍රමාණය හා රජය මගින් මහජනතාවට ලබාදී ඇති බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රක්ෂිත වනාන්තර භූමි ඉහත පරිදි මිනිසාගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීම නිසා ජල පෝෂක ප්‍රදේශ විනාශ වී යන බව පිළිගන්නේද;

(iii) එසේ නම්, මෙම තත්ත්වය වැළැක්වීම සඳහා කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4773/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රෝහල්වල ඖෂධ හිඟයට පිළියමක් ලෙස ප්‍රාදේශීය වශයෙන් ඖෂධ මිලදී ගැනීම සඳහා අවසර දී තිබේද;

(ii) ඒ සඳහා මිල ගණන් ලබා ගන්නා ආකාරය කවරේද;

(iii) එම මිල ගණන් වෛද්‍ය සැපයුම් අංශය සමග සංසන්දනය කිරීමට වැඩ පිළිවෙළක් තිබේද;

(iv) පේරාදෙණිය මහ රෝහලේ ඖෂධ මිලදී ගැනීම්වලදී සිදු වී ඇති අක්‍රමිකතා පිළිබඳව අමාත්‍යාංශය දැනුවත් වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5245/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1995.10.11 දින සිට ක්‍රියාත්මක වූ ගොවි විශ්‍රාම වැටුපට අදාළ නව වැඩපිළිවෙළ අනුව එම වැටුප ලබමින් සිටියදී මිය ගිය අයෙකුගේ කලත්‍රයාට හෝ යැපෙන්නාට හිමි මාසික විශ්‍රාම වැටුප 2014.01.01 දින සිට ගෙවීමට ක්‍රියා කරන්නේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2014.01.01 දින සිට ආරම්භ වූ නව වැඩපිළිවෙළ අනුව 1987 වර්ෂයේ දී එවකට විසිහත්වන වියේ සිටියදී එකවර රු. 3400/- ක මුදලක් ගෙවා ගොවි විශ්‍රාම වැටුප් හිමිකම ලැබූ අයෙකු, 2010 වර්ෂයේදී එවකට හතලිස් පස්වන වියේ සිටියදී එකවර රු. 5740/- ක මුදලක් ගෙවා ඊට දායක වූ අයෙකු සහ 1987 වර්ෂයේදී විසිහත්වන වියේ සිටියදී ගොවි විශ්‍රාම වැටුපට අර්ධ වාර්ෂික වාරිකය ලෙස රු. 175/- ක මුදලක් ගෙවමින් සිටි අයෙකු ඔවුන්ගේ විශ්‍රාම වැටුපට හිමිකම් ලබා ගැනීම සඳහා අමතර මුදලක් ගෙවිය යුතු වන්නේද;

(ii) එසේ නම්, ඉහත සඳහන් එම එක් එක් අවස්ථාවට අදාළව, එම පුද්ගලයින් ගෙවිය යුතු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5870/'15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ කැසිනෝ සූදු ව්‍යාපාර පවත්වාගෙන යන බව දන්නේද;

(ii) එම කැසිනෝ සූදු ව්‍යාපාර ආරම්භ වූ කාල පරිච්ඡේදය කවරේද;

(iii) මේ වන විට මෙරට ඇති කැසිනෝ ව්‍යාපාරික ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ව්‍යාපාරික ස්ථාන පවත්වාගෙන යනු ලබන පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5899/'15

ගරු ලසන්ත අලගියවන්න මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරන ලද මුදල කොපමණද;

(ii) ඉහත මුදල දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

(iii) දළ දේශීය නිෂ්පාදිතයෙන් 6%ක ප්‍රතිශතයක් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කිරීමට හැකි වන වර්ෂය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5916/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.08 දින පැවති ජනාධිපතිවරණයෙන් පසු දේශපාලනික හෝ වෙනයම් හේතු මත පොලිස් හෝ වෙනත් ආරක්ෂක අංශවල පරීක්ෂාවන්ට ලක්වූ කතෝලික දේවස්ථාන, හින්දු ආගමික ස්ථාන සහ මුස්ලිම් දේවස්ථාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එසේ පරීක්ෂාවට ලක්කළ එක් එක් අදාළ ආගමික ස්ථානයේ නම, ලිපිනය, දුරකථන අංකය පරීක්ෂාවට ලක් කළ දිනය සහ ඊට අදාළ වූ හේතුන්, කතෝලික, හින්දු සහ මුස්ලිම් යන දේවස්ථාන අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4534/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1980 ජූලි වර්ජනයේදී රැකියා අහිමි වූ, මෙතෙක් සහනයක් නොලැබුණු පුද්ගලයින්ට රු. 5000.00ක දීමනාවක් ලබා දෙන බවට වූ 2013 අය වැය යෝජනාව අනුව, මේ දක්වා එම දීමනාව ලබා දී ඇති පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දීමනාව ලබා දීම සඳහා රජය විසින් මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් යෝජනාව ක්‍රියාත්මක කිරීම ආරම්භ වන විට කිසිදු ප්‍රතිලාභයක් නොලබාම මිය ගොස් සිටි ජූලි වර්ජකයින්ට හිමි එකී ප්‍රතිලාභය අදාළ හිමිකරුවන් වෙත ලබා දීම සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) 1980 ජූලි වර්ජනයට සහභාගී වී මෙතෙක් සහනයක් නොලැබූ අයකු ඉහත සඳහන් මුදල ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4778/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ඇති සමස්ත රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) පළාත් සභා යටතේ ඇති රෝහල් සංඛ්‍යාව කොපමණද;

(iii) 2012 අයවැය මගින් පළාත් සභා යටතේ වන රෝහල්වල ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා වූ වැඩ සටහන් ක්‍රියාත්මක කර තිබේද;

(iv) එම වැඩ සටහන් යටතේ පළාත් සභා මගින් ප්‍රාදේශීය රෝහල් සඳහා අවශ්‍ය නොවන උපකරණ බෙදා හැර තිබූ බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (අ)(iii)හි සඳහන් වැඩ සටහන යටතේ පළාත් සභා රෝහල් සඳහා වෙන් කළ මුදල් ප්‍රමාණය එක් එක් පළාත් සභාව අනුව, වෙන් වෙන් වශයෙන් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5575/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට ක්‍රියාත්මක වන ආයුර්වේද පනත හඳුන්වා දුන් වර්ෂය කවරේද;

(ii) මේ වන විට එම පනත සංශෝධනය කර ඇති වාර ගණන කොපමණද;

(iii) එය අවසන් වරට සංශෝධනය කළ වර්ෂය කවරේද;

(iv) මෙතෙක් එම පනත සංශෝධනය කර නොමැති නම්, එයට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන් හඳුන්වනු ලබන්නේ වෛද්‍ය නිලධාරීන් ලෙසද; නැතහොත්, වෛද්‍ය වෘත්තිකයන් ලෙස ද;

(ii) ඔවුන් එම නාමයෙන් හැඳින්වීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5871/'15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දින 100 වැඩසටහන යටතේ ජනතාවට විශාල සහන ප්‍රමාණයක් ලබාදුන් බවත්;

(ii) ඒ සඳහා අමතර වැයක් දැරීමට සිදු වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් අමතර වැය දැරීම සඳහා 2014 සම්මත අයවැය ලේඛනයේ යෝජනා වෙනස් කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නොමැතිනම්, අමතර මුදල් ඉපයීමට ගත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4538/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2013 අය වැය යෝජනා මගින් විදේශ රැකියා සඳහා පිටත්ව යන ශ්‍රී ලාංකිකයින්ගේ නිපුණතා ඉහළ මට්ටමට ගෙන ඒම සඳහා සහ එම රටවල සමාජ හා සංස්කෘතික පරිසරයට අනුගත වීම පහසු කිරීම සඳහා සුවිශේෂ පාඨමාලා ඇතුළත් නව විදේශ රැකියා තාක්ෂණික විද්‍යාල දෙකක් පිහිටුවීමට යෝජනා කළ බව දන්නේද;

(ii) එම විද්‍යාල දෙක පිහිටුවා ඇති ස්ථාන කවරේද;

(iii) ඒ සඳහා ආයෝජනය කළ මුළු මුදල කොපමණද;

(iv) එම තාක්ෂණික විද්‍යාලවල පුහුණුව ලබාදෙන රැකියා ක්ෂේත්‍ර කවරේද;

(v) මේ වන විට එම ආයතන වෙතින් පුහුණුව ලබා විදේශ රැකියා සඳහා පිටත්ව ගොස් ඇති රටවිරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4781/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දිවයින තුළ මේ වන විට ඖෂධ මිල පාලනයක් ක්‍රියාත්මක වන්නේද;

(ii) කලකට පෙර දී ශ්‍රී ලංකාව තුළ ඖෂධ මිල පාලනයක් ක්‍රියාත්මක වූ බව දන්නේද;

(iii) එසේ නම්, එම මිල පාලනය ක්‍රියාත්මක වූ කාල සීමාව කවරේද;

(iv) එම කාල සීමාව තුළදී මිල පාලනය සිදු කළ ඖෂධ වර්ග සංඛ්‍යාව කොපමණද;

(v) ඖෂධ මිල පාලනය සඳහා පත් කර ඇති කමිටුව මේ වන විට ඊට අදාළ නිර්දේශ ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5576/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂයේ උපාධිධාරීන්ට රැකියා ලබාදීම සඳහා අයදුම්පත් කැඳවූ අවස්ථාවේදී ඒ සඳහා ඉල්ලුම් කර තිබූ ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් රැකියා ලබා දුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011.12.31 දින වන විට රැකියා විරහිතව සිටි ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2012 වර්ෂයේදී ඔවුන්ට රැකියා ලබාදීම සඳහා වැඩපිළිවෙළක් සකසා තිබුණේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iv) ඒ යටතේ රැකියා ලබා දුන් ආයුර්වේද වෛද්‍යවරු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5872/'15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අප රටේ ග්‍රාමීය අධ්‍යාපන පද්ධතිය නගා සිටුවීම සඳහා ද්විතීයික පාසල් වැඩසටහන ආරම්භ කළ බවත්;

(ii) එම වැඩසටහනට ඇතුළත් කිරීමට සුදුසු වුවත්, ඇතැම් පාසල් ඊට ඇතුළත් වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද ?

(ආ) (i) කුලි/නක්කාවත්ත මහින්ද මධ්‍ය මහා විද්‍යාලය සහ කුලි/වීරපොකුණ මහා විද්‍යාලය ද්විතීයික පාසල් වැඩසටහනට ඇතුළත් විය යුතු පාසල් ලෙස සලකා බලනු ලබන්නේද;

(ii) එසේ නම්, එම පාසල් දෙකෙහි අධ්‍යාපනය ලබන දරුවන්ට සිදුවී ඇති අසාධාරණය මග හරවා එම පාසල් දෙකද ද්විතීයික පාසල් වැඩසටහනට ඇතුළත් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5913/'15

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආර්ථික සංවර්ධන, ඵලදායිතා ප්‍රවර්ධන ඇතුළු එවකට පැවති අමාත්‍යාංශ කිහිපයක් අහෝසි කර එම අමාත්‍යාංශයන්ට අනුයුක්තව සේවය කළ සංවර්ධන නිලධාරීන් ඉටු කළ කාර්යයන් අත්හිටුවා ඇති බවත්;

(ii) එබැවින් එම නිලධාරීන් දහස් ගණනක් මේ වන විට කිසිදු රාජකාරියක් නොමැතිව සිටින බවත්;

(iii) ඔවුන්ට කාර්යාල පවත්වාගෙන යෑමට රජයෙන් ලබා දී තිබූ දීමනාවද මේ වන විට අහෝසිකර ඇති බවත්;

(iv) එම හේතුවෙන් බදු පදනම මත භාවිත කළ කාර්යාල ගොඩනැගිලිවලින් ඉවත්වීමට සිදුවී ඇති බවත්;

(v) එබැවින් එම කාර්යාලවලට ලබා දී තිබූ රජයේ දේපළ අනාරක්ෂිත තත්ත්වයකට පත්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) හි සඳහන් කරුණු සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(ii) ඉහත සඳහන් අමාත්‍යාංශයන්හි දැනට සේවය කරන සංවර්ධන නිලධාරීන් සහ බඳවා ගත් උපාධිධාරීන් විධිමත් ලෙස රාජ්‍ය සේවයට ඇතුළත් කොට උසස්වීම් ක්‍රමයක් හඳුන්වා දෙන බවට දින 100 වැඩසටහනෙහි සඳහන් පොරොන්දුව පරිදි එම නිලධාරීන් දින 100 ඇතුළතදී ඵලදායී කාර්යයක යොදවන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2015 අප්‍රේල් මස 22 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4589/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) විදේශීය රටවල රැකියා සඳහා ගොස් සිටින රට විරුවන්ට විශ්‍රාම වැටුපක් ලබාදීම සඳහා 2010 ජනාධිපතිවරණයට පෙර පොරොන්දු වූ බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, රට විරුවන් සඳහා විශ්‍රාම වැටුපක් ලබාදීමට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) රට විරුවන් සඳහා විශ්‍රාම වැටුප ලබාදීමේදී රට විරුවන්ගෙන්, රැකියා ආයතනයෙන් සහ රජය මඟින් දායකත්වය දරනු ලබන ආකාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම විශ්‍රාම වැටුප ලෙස මාසිකව ලබාදීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iv) විදේශ රැකියාවල නියුතුවූවන්ට විශ්‍රාම වැටුප් ලබා දෙන ලෝකයේ වෙනත් රටවල් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4783/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2005 සිට 2013 දක්වා කාල සීමාවේදී,

(i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුල වන අලි පහරදීම් නිසා මිය ගිය පුද්ගලයින් සංඛ්‍යාව;

(ii) මිනිස් ක්‍රියාකාරකම් නිසා එම දිස්ත්‍රික්කය තුළ මිය ගිය වන අලි සංඛ්‍යාව;

(iii) සමස්ත දිවයින තුළ මියගිය වන අලි සංඛ්‍යාව;

වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5873/'15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ රැකියාවල නියුතුවූවන්ගෙන් වාර්ෂිකව විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අප රටට ලැබෙන බවත්;

(ii) මේ වනවිට ශ්‍රී ලාංකිකයින් කොරියාවේ රැකියාවල නියුතුව ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂයේදී මෙරට ශ්‍රමිකයින්ට කොරියාවේ රැකියා අවස්ථාවන් හිමිව තිබේද;

(ii) එසේ නම්, එම රැකියා අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(iii) එම රැකියා අවස්ථා මේ වන විට ලැබී නොමැති නම්, එම අවස්ථා ලබා ගැනීම සඳහා කඩිනමින් පියවර ගන්නේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4784/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දිවයින තුළ වන අලි නිසා සිදුවන මිනිස් ජීවිත හානි සංඛ්‍යාව අවම කිරීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග කවරේද;

(ii) වන අලින්ගෙන් ආරක්ෂා වීම සඳහා මුළු දිවයිනටම අවශ්‍ය වී ඇති විදුලි වැටවල (අලි වැටවල) දිග ප්‍රමාණය පිළිබඳ දැනුවත් භාවයක් තිබේද;

(iii) එසේ නම්, එම අවශ්‍යතාව කොපමණද;

(iv) කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා අවශ්‍ය විදුලි වැටවල දිග ප්‍රමාණය කොපමණද;

(v) විදුලි වැට ඉදිකිරීම සඳහා මෙවර අයවැයෙන් මුදල් වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4813/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි වී දැනට නිදහස් වෙළඳ කලාපය තුළ වාහන එකලස් කර විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන සී/ස වෙහිකල්ස් ලංකා පුද්ගලික සමාගම විසින් අලෙවි කරනු ලබන මෝටර් රථ මාසයක් ඇතුළත ලියාපදිංචි කරන බවට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ ලිපියක් ගැණුම්කරුවන්ට පෙන්වනු ලබන බවත්;

(ii) එසේ නමුත්, එම සමාගම මගින් විකුණන ලද වාහන ලියාපදිංචි කිරීම, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන බවත්;

(iii) ඒ හේතුවෙන් එම සමාගමෙන් මෝටර් රථ මිල දී ගෙන ඇති ගැණුම්කරුවන් විශාල සංඛ්‍යාවක් තම වාහන ධාවනය කිරීමට නොහැකිව දැඩි අපහසුතාවයකට පත්වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) සී/ස වෙහිකල්ස් ලංකා පුද්ගලික සමාගමෙන් මිලදී ගන්නා ලද වාහන, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිකර ගැනීම සඳහා පහසුකම් සලසා දෙන්නේදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5874/'15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අප රටේ අධිකරණ පද්ධතිය පිළිබඳව ජනතාව තුළ විශාල විශ්වාසයක් පවතින බවත්;

(ii) විවිධාකාරයේ අගතීන්ට පත් ජනතාව අධිකරණයේ පිහිට පතන බවත්;

(iii) ඇතැම් අධිකරණ ක්‍රියාවලීන්ගේ පවතින අධික ප්‍රමාදය නිසා ජනතාව දැඩි පීඩනයට ලක්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අධිකරණ ක්‍රියාවලිය තුළ සිදුවන ප්‍රමාදවීම් අඩුකර ජනතාවට සහනයක් ලබාදීමට කඩිනම් පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4819/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් කුලී පදනම මත ලබා ගත් වායු සමනය කළ සුඛෝපභෝගී වාහන ගුවන් හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා යොදා ගන්නා බවත්;

(ii) එම වාහන සඳහා ඉන්ධන රජයෙන් ලබා ගන්නා බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කුලී පදනම මත ලබා ගත් සුඛෝපභෝගී වාහන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පෞද්ගලික පරිහරණය සඳහා යොදා ගැනීමට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ එකඟතාවය ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, එම වාහන පරිහරණය පිළිබඳව පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iii) එම පරීක්ෂණයේ ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5223/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී සමස්ත බැංකු සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම එක් එක් බැංකුවේ වත්කම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් බැංකුව මගින් රජයට ලබා දී ඇති ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම බැංකු මගින් රජයට ලබාදුන් ණය නැවත අය කර ගැනීම සඳහා ක්‍රමවේදයක් තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5880/'15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— කාන්තා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) ගැබිනි මාතාවක් සඳහා රු. 20,000ක ආධාර මුදලක් ලබා දීමට පියවර ගත් බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) එක් වර්ෂයකදී ශ්‍රී ලංකාව තුළ සිදුවන දරු උපත් සංඛ්‍යාව දළ වශයෙන් කොපමණද;

(ii) 2015 වර්ෂයේ දී ඉහත සඳහන් ගැබිනි මාතා ආධාර ලබාදීම සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(iii) ආධාර ලබා දීම සඳහා ගැබිනි මාතාවන් තෝරා ගනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5934/'15

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා,— බුද්ධ ශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කතරගම දේවාලය සතු ඉඩම් වපසරිය කොපමණද;

(ii) එම ඉඩම් පුද්ගලයින්ට හෝ සමාගම්වලට කල්බදු ක්‍රමය යටතේ හෝ වෙන යම් ක්‍රමවේදයකට ලබා දී තිබේද;

(iii) එසේ ලබා දී තිබේ නම්, ඉඩම් ලබා දී ඇති එක් එක් පුද්ගලයාගේ හෝ සමාගමේ නම සහ අදාළ ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් ඇතුළත් ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(iv) ඉහත සඳහන් ඉඩම් ලබාදීම් බෞද්ධ විහාර හා දේවාලගම් ආඥාපනත යටතේ විනිවිදභාවයෙන් යුතුව සිදුවී තිබේද;

(v) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 අප්‍රේල් මස 23 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4987/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2013 වර්ෂයේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය පැවැත්වීම සඳහා,

(i) ස්ථාපිත කළ මධ්‍යස්ථාන;

(ii) එම මධ්‍යස්ථාන සම්බන්ධීකරණය කිරීම සඳහා ක්‍රියාත්මක වූ සම්බන්ධීකරණ මධ්‍යස්ථාන;

(iii) සේවයේ යොදවාගත් ශාලාධිපතිවරු;

(iv) යොදාගත් ගුරුවරු;

(v) යොදා ගත් ශාලා කාර්ය සහායකයන්;

සංඛ්‍යාව කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (අ)(v)හි සඳහන් ශාලා කාර්ය සහායකයින්ගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක වෙන් වෙන් වශයෙන් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) ඉහත නම් සඳහන් ශාලා කාර්ය සහායකයින්ගෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට අයත් සේවක සංඛ්‍යාව සහ එම ක්ෂේත්‍රයට අයත් නොවන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උක්ත විභාගයේ කටයුතු සඳහා බාහිරව බඳවා ගත් ශාලා කාර්ය සහායකයින්ගේ වැටුප් හා දීමනා වෙනුවෙන් ගෙවූ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) අධ්‍යාපන අනධ්‍යයන සේවකයින් සිටියදී බාහිර පුද්ගලයන් විභාග කටයුතු සඳහා යොදා ගැනීම නිසා එම සේවකයන්ට දීමනාවක් ලබා ගැනීමට ඇති අවස්ථාව අහිමි වීම වැළැක්වීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

5224/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම දිස්ත්‍රික්කයේ ඇති මුඩුක්කු නිවාස හා ලැයිම් කාමර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) දිස්ත්‍රික්කයේ සිටින නිවාස නොමැති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැසිකිලි නොමැති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) වැසිකිලි නොමැති නිවාස සඳහා වැසිකිලි ලබා දීමේ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5881/'15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයට අදාළව ක්‍රිකට් පාලක මණ්ඩලයක් පත්කර තිබේද;

(ii) ඒ සඳහා නිලවරණයක් පවත්වා තිබේද;

(iii) එසේ නම්, එම නිලවරණය පවත්වන ලද දිනය කවරේද;

(iv) එම නිලවරණයේ දී පත්වූ නිලධාරී මණ්ඩලය කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4999/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිස්ත්‍රික් ලේකම්වරුන්ට සහ ප්‍රාදේශීය ලේකම්වරුන්ට පිළිවෙළින් රු.15,000.00ක් සහ රු.5,000.00ක්ද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුබද්ධ සැලසුම් අධ්‍යක්ෂවරුන්ට හා ප්‍රධාන ගණකාධිකාරීවරුන්ට රු.3,000.00ක් ද වශයෙන් දිරි දීමනා ලබා දෙන බවට වූ 2014 අයවැය යෝජනාව මේ වන විට ඉටු කර තිබේද;

(ii) එසේ නම්, එම දීමනා ලබා දීම ආරම්භ කළ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුබද්ධ සැලසුම් අධ්‍යක්ෂවරුන්ට හා ප්‍රධාන ගණකාධිකාරීවරුන්ට අඩු වටිනාකමකින් යුතු දිරි දීමනාවක් ගෙවීමට යෝජනා කිරීමට හේතු කවරේද;

(ii) අඩු වටිනාකමකින් යුතු දිරි දීමනාවක් ගෙවීමට තීරණය කිරීම නිසා ඉහත (ආ)(i) හි සඳහන් නිලධාරීන්ගේ සේවය අවතක්සේරුවීමක් සිදුවී ඇති බව එතුමා පිළිගන්නේද;

(iii) එසේ නම්, ඔවුන්ගේ දිරි දීමනා ඉහළ දැමීමට කටයුතු කරන්නේද;

(iv) එම වැඩි කරනු ලබන ප්‍රමාණය කොපමණද;

(v) එම වැඩි කිරීම සිදු කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5225/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහා මාර්ග සංවර්ධනය සඳහා දේශීය බැංකු මගින් මුදල් ලබා දෙන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එසේ නම්, මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල් ලබා දී ඇති දේශීය බැංකු කවරේද;

(ii) එම එක් එක් බැංකුව මගින් ලබා දී ඇති මුදල් ප්‍රමාණය සහ මුදල් ලබා දී ඇති මහා මාර්ග ව්‍යාපෘති වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) ලබා දුන් මුදල් නැවත බැංකු වෙත ලබා ගැනීමේ ක්‍රමවේදය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5883/'15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ස්වාධීන රූපවාහිනී ආයතනය ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ස්වාධීන රූපවාහිනී ආයතනය තුළ සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) 2015 වර්ෂය තුළ එම ආයතනයට නවක සේවකයින් බඳවාගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5722/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස, හුලංදාව වතුයාය ආශ්‍රිතව ජීවත් වන ජනතාවට අවම මූලික පහසුකම්වත් නොමැති බවත්;

(ii) එම නිසා එම ජනතාව දැඩි අපහසුතාවන්ට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) හුලංදාව වතුයාය ආශ්‍රිතව වෙසෙන ජනතාවට අවශ්‍ය පානීය ජලය, මාර්ග පහසුකම් සහ නිවාස හා සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කෙසේද;

(iii) එම පියවර ගනු ලබන දිනය කවරේද;

(iv) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5884/'15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,—අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වත්මන් මහ බැංකු අධිපතිවරයාගේ නම සහ පදිංචි ස්ථානය කවරේද;

(ii) එම මහ බැංකු අධිපතිවරයා පත්කරනු ලැබුවේ කවුරුන් විසින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2015 අප්‍රේල් මස 24 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

5723/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සංචාරක වීසා මත ශ්‍රී ලංකාවට පැමිණ නීති විරෝධී ලෙස රට තුළ රැඳී සිටිමින් විවිධ ආගම් ප්‍රචාරය කළ, විවිධ රැකියා හා ව්‍යාපාරවල නිරතවූ හා සමාජ විරෝධී කටයුතුවලට සම්බන්ධ වූ සංචාරකයන් කොපමණ සංඛ්‍යාවක් 2014 වර්ෂය තුළ අත්අඩංගුවට ගෙන තිබේද;

(ii) ඔවුන් අයත් රටවල් කවරේද;

(iii) අත්අඩංගුවට ගත් එම එක් එක් පුද්ගලයා විසින් සිදු කරන ලද නීති විරෝධී කටයුත්ත හා ලබාදුන් දඬුවම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සංචාරක වීසා මත පැමිණ නීති විරෝධීව රට තුළ රැඳී සිටින විදේශිකයන් අත්අඩංගුවට ගැනීමට විශේෂ වැඩපිළිවෙළක් සකසා තිබේද;

(ii) මේ සම්බන්ධයෙන් බලාත්මක වන නීති රෙගුලාසි තවදුරටත් දැඩි කිරීමට කටයුතු කරන්නේද

(iii) එසේ නම්, ඒ කුමන ආකාරයෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5886/'15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අප රටේ මහජන සාමය ආරක්ෂා කිරීමට පොලිස් දෙපාර්තමේන්තුවෙන් විශාල සේවාවක් සිදුවන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට පොලිස් දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන සියලුම නිලධාරීන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිලධාරීන්ට මේ වන විට ප්‍රමාණවත් වැටුපක් ලබා දෙන්නේද;

(iii) පොලිස් නිලධාරීන්ගේ වැටුප් වැඩි කිරීමට අපේක්ෂා කරන්නේද;

(iv) එසේ නම්, එය සිදු කරන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5754/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බෝගම්බර බන්ධනාගාරයෙන් රැඳවියන් ඉවත් කළ පසු එය පිරිසිදු කිරීම සඳහා වැය කළ මුදල කොපමණද;

(ii) එම මුදල සපයාගත් මූලාශ්‍ර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බෝගම්බර බන්ධනාගාරය වර්තමානයේ කුමන කටයුත්තක් සඳහා භාවිතා කරනු ලබන්නේද;

(ii) එහි අයිතිය පෞද්ගලික ආයතනයකට හෝ පුද්ගලයෙකුට පවරා තිබේද;

(iii) එසේ නම්, එම ආයතනයේ හෝ පුද්ගලයාගේ නම, ලිපිනය හා දුරකථන අංක කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5887/'15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 වර්ෂයේ ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය සජීවීව නැරඹීමට ජනතාව තුළ දැඩි උනන්දුවක් පැවති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2015 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය මෙරට ජනතාවට සජීවීව නැරඹීමේ අවස්ථාව සලසා දුන් රූපවාහිනී නාලිකාව කවරේද;

(ii) එම විකාශන අයිතිය ලබා ගැනීමට වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5755/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2014 දක්වා ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ජනතාවගේ පරිභෝජනය සඳහා නිකුත් කළ ජලය ලීටර් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) දැනට නල ජල පහසුකම් ලබා ගන්නා මුළු පාරිභෝගිකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පාරිභෝගික සංඛ්‍යාව සමස්ත ජනගහනයේ ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට නල ජල පහසුකම් නොමැති, එහෙත් ජල පහසුකම් අත්‍යාවශ්‍ය ජනතාව පිළිබඳ සමීක්ෂණයක් කර තිබේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ට අවශ්‍යවන ජල ලීටර් ප්‍රමාණය ඇස්තමේන්තු කර තිබේද;

(iv) එසේ නම්, එම ප්‍රමාණය කොපමණද;

(v) එම ජල ප්‍රමාණය සපයා ගැනීමට ප්‍රමාණවත් ජල මූලාශ්‍ර රට තුළ තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මුහුදු ජලය පිරිපහදු කර පානීය ජලය ලෙස ජනතාවට ලබාදීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එම සැලසුම් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5888/'15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මකව ඇති ජාත්‍යන්තර වරායන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වරායන්හි නම් කවරේද;

(iii) මාගම්පුර මහින්ද රාජපක්ෂ වරාය ඉදිකිරීමට මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

(iv) 2014 වර්ෂයේ දී එම වරාය තුළින් උපයාගෙන ඇති මුදල කොපමණද;

(v) මේ වන විට එකී වරාය ලාභ ලබන්නේද; නැතහොත්, පාඩු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

*

අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— 2010 වර්ෂයේ සිට සහ ඉන් අනතුරුව කොටස් වෙළඳපොළ තුළ සිදු වී ඇති සැකසහිත හෝ නීති විරෝධී ගනුදෙනු පිළිබඳව විමර්ශනය කර වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

ශ්‍රී ලංකාවේ කොටස් වෙළඳපොළ ගණුදෙනුවල විනිවිදභාවය හා යෝග්‍යතාවය පිළිබඳ බරපතල සැක මතුවී ඇති හෙයින් ද;

කොටස් වෙළඳපොළේ රහස්‍ය තොරතුරු ලබාගත් රජයේ හා ඉන් පරිබාහිර ආයතනවල ඉහළ තනතුරු දරන ඇතැම් පුද්ගලයින් විසින් කූට ගනුදෙනු හා ඒ හා සමාන අයථා ක්‍රියාවන්හි නිරත වී ඇති බව හා නිරත වෙමින් සිටින බව වාර්තා වන හෙයින් ද;

මෙවන් සිද්ධීන් ශ්‍රී ලංකාවේ කොටස් වෙළඳපොළ ගනුදෙනු වල විශ්වසනීයත්වය කෙරෙහි ඉතා හානිකර ලෙස බලපෑ හැකි හෙයින් ද;

මේ පිළිබඳව ප්‍රතිකර්මීය පියවර නොගන්නේ නම්, ශ්‍රී ලංකාව කෙරෙහි ආයෝජකයන් තුළ ඇති විශ්වාසය බරපතල කඩාවැටීමකට ලක්වන හෙයින් ද;

පහත දැක්වෙන කරුණු පිළිබඳව විමර්ශනය කොට වාර්තා කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

(අ) 2010 වර්ෂයේ සිට සහ ඉන් අනතුරුව කොටස් වෙළඳපොළ තුළ සිදුවූ කිසියම් ගනුදෙනුවක් සැකසහිත හෝ නීති විරෝධී ස්වභාවයෙන් යුක්තවේද;

(ආ) මෙම කාලසීමාව තුළ කොටස් වෙළඳපොළෙහි තොරතුරු රහසේ ලබා ගනිමින් කොටස් වෙළඳපොළ තුළ සිදු කළ කූට ගණුදෙනු පිළිබඳ සාක්ෂි තිබේද;

(ඇ) රජයේ අරමුදල් භාවිතා කරමින් සිදු කළ වංචාවන් පිළිබඳ සාක්ෂි තිබේද;

(ඈ) එසේ නම්, එම නීති විරෝධී ගණුදෙනු හා වංචාවන් පිළිබඳව වගකිවයුතු පුද්ගලයින් කවුරුන්ද;

(ඉ) කොටස් වෙළඳපොළේ වෙනයම් අයථා ක්‍රියා සිදුවීම් පිළිබඳව සාක්ෂි තිබේද;

(ඊ) එසේ නම්, එම අයථා ක්‍රියා කවරේද;

(උ) එම අයථා ක්‍රියා සම්බන්ධයෙන් වගකිවයුතු පුද්ගලයින් කවුරුන්ද;

(ඌ) කොටස් ගනුදෙනු ඒවා පාලනය කරනු ලබන්නාවූ නීති රෙගුලාසිවලට අනුකූල ලෙස සිදුවන බවට වගබලා ගැනීමේ වගකීම පැවරී ඇති පුද්ගලයින් එසේ නොකිරීම පිළිබඳ සාක්ෂි තිබේද;

(එ) එවැනි නීති විරෝධී ගනුදෙනු හා අයථා ක්‍රියා ඉදිරියේදී නැවත සිදුවීම වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර හා ක්‍රියාමාර්ග කවරේද; සහ

(ඒ) විමර්ශනයට අදාළ වේයැයි සිය අභිමතය පරිදි කාරක සභාව නිශ්චය කරන අනෙකුත් වෙනත් කරුණු;

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු ය.

(ආ) ස්ථාවර නියෝග අංක 95හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, කාරක සභාව සාමාජිකයින් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

3. එකී කාරක සභාවට,

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) යම් තැනැත්තෙකු කැඳවීමට, යම් ලේඛන හෝ වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ එම කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට හා එබඳු තැනැත්තෙකු සන්තකයෙහි හෝ පාලනය යටතේ පවතින යම් ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂිකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට හා කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ සාක්ෂිකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයින්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඉ) කලින්කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල්තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමට ද

බලය තිබිය යුතුය.

4. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට වර්ෂයක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබා දෙන අන් කවර කාල සීමාවක් තුළ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*